Library

# ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 42 දරන පලාත් පාලන ආයතන නිල නිවාස (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1978 සැප්තැම්බර් මස 6 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1978 සැප්තැම්බර් මස 15 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 55 යි — තැපැල් ගාස්තුව : ශත 15 යි

[සහතිකය සටහන් කළේ 1978 සැප්තැම්බර් මස 6 වන දින]

එල්.ඩී.—ඕ. 62/75

තැනැත්තන්ගේ පදිංචිය සඳහා පළාත් පාලන ආයතන විසින් එහෝ පළාත් පාලන ආයතන වෙනුවෙන් සපයනු ලබන නිල නිවාසවල සන්තකය ආපසු ලබා ගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසත් එම නිල නිවාස පළාත් පාලන ආයතනවල සේවානියුක්තයන්ට වෙන් කර දිය හැක්කේ යම් නියමවලට හා කොන්දේසිවලට යටත්ව ද ඒ නියම හා කොන්දේසි නියම කිරීමට හැකි කරවීම පිණිසත් ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසත්. වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 42 දරන පළාත් පාලන ආයතන නිල නිවාස (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනතේ විධිවිධාන— මේ පනත අදාළවීම.

(අ) සියලුම පළාත් පාලන ආයතන නිල නිවාසවලට අදාළ විය යුතු ය; තව ද

(ආ) තැනැත්තන් විසින් ඒ නිල නිවාසවල පදිංචිවීම සම්බන්ධයෙන් ගම්‍යමාන කොන්දේසියක් වූ ලෙස හා විය යුතු ලෙස සියලු කල්හි සලකනු ලැබිය යුතු ය.

3. (1) (i) යම් පළාත් පාලන ආයතන නිල නිවාසයක පදිංචිකරුට ඒ නිල නිවාසය දෙනු ලැබුවේ යම් කාල සීමාවකට ද ඒ කාලසීමාව ඉකුත් වී ඇති; හෝ අස් කිරීමේ දැන්වීම භාරදීම.

(ii) ඒ නිල නිවාසයේ පදිංචිවීමට ඒ පදිංචිකරුට සුදුසුකම ලැබීමට හේතු වූ සේවා ස්ථානයෙන් ඔහු මාරු කරනු ලැබූ; හෝ

(iii) ඒ නිල නිවාසයේ පදිංචිවීමට ඒ පදිංචිකරුට සුදුසුකම ලැබීමට හේතු වූ තනතුරෙන් ඔහු මාරු කරනු ලැබූ; හෝ

(iv) මුලින් ම ඒ නිල නිවාසය දෙනු ලැබූ ඒ පදිංචිකරු තම තනතුරෙන් ඉල්ලා අස්වූ, විශ්‍රාම ගත් හෝ තම තනතුර හිස් කළ හෝ ඒ පදිංචිකරුගේ සේවය නතර කරනු ලැබූ හෝ ඔහු මිය ගිය

අවස්ථාවක, නියම බලධරයා විසින් ඒ පදිංචිකරු වෙත, දැන්වීමෙහි සඳහන් කළ යුතු මාස දෙකකට අඩු නොවන කාලසීමාවක් ඉකුත් වීමට පෙර—

2—ඒ 35918–11,632 (78/08)

(අ) තමාගේ යැපෙන්නන් කිසිවකු වෙතොත් ඔවුන් ද සමග ඒ නිල නිවාසය හිස් කොට යන ලෙස ; සහ

(ආ) ඒ නිල නිවාසයේ හිස් සන්තකය නියම බලධරයාට හෝ ඒ නිවාසයේ සන්තකය භාර ගැනීමට බලය දී ඇත්තාවූ ද දැන්වීමෙහි සඳහන් කර ඇත්තා වූ ද වෙනත් තැනැත්තකුට භාර දෙන ලෙස

ඒ පදිංචිකරුට නියම කරමින්, දැන්වීමක් භාර දිය යුතු බවට යම් පළාත් පාලන ආයතනයක් විසින් ඒ පළාත් පාලන ආයතනයේ යම් රැස්වීමක දී යෝජනාවක් සම්මත කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් ඒ යෝජනාව සම්මත කරනු ලැබූ අවස්ථාවක, නියම බලධරයා විසින් ඒ අනුව ඒ දැන්වීම ඒ යෝජනාව සම්මත කිරීමට තුඩු දුන් හේතු ද සඳහන් කරමින් පදිංචි කරු වෙත භාර දිය යුතු ය.

(3) යම් පළාත් පාලන ආයතන නිල නිවාසයක් සම්බන්ධයෙන් (2) වන උපවගන්තිය යටතේ යම් පදිංචිකරුවකු වෙත භාර දෙනු ලබන සෑම දැන්වීමක් ම "අස් කිරීමේ දැන්වීමක්" යනුවෙන් මේ පනතෙහි සඳහන් කරනු ලැබේ.

(4) යම් පළාත් පාලන ආයතන නිවාසයක් සම්බන්ධයෙන් වූ අස්කිරීමේ දැන්වීමක්, ඒ දැන්වීම ඒ නිවාසයේ ලිපිනයට එහි පදිංචි කරු වෙත ලියාපදිංචි තැපෑලෙන් යවනු ලැබූවහොත් ඒ නිවාසයෙහි පදිංචිකරු වෙත එය භාර දෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) සෑම අස් කිරීමේ දැන්වීමක් ම මේ පනතෙහි උපලේඛනයේ දක්වා ඇති "අ" ආකෘතිය අනුව විය යුතු ය.

අමාත්‍යවරයා වෙත ආයාචනය කිරීමේ අයිතිය.

4. (1) නියම බලධරයා විසින් 3 වන වගන්තිය යටතේ තමා වෙත භාර දෙන ලද අස් කිරීමේ දැන්වීමක් නිසා අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, ඒ දැන්වීමෙහි සඳහන් කාලසීමාව ඉකුත්වීමට පෙර ඒ පළාත් පාලන ආයතන නිවාසය හිස් කොට එහි හිස් සන්තකය භාර දිය යුතු බවට ඒ දැන්වීමෙහි සඳහන් නියමයට විරුද්ධව, අමාත්‍යවරයා වෙත ලියවිල්ලකින් වූ ආයාචනයක් ඒ අස් කිරීමේ දැන්වීම එම තැනැත්තා වෙත භාර දෙනු ලැබූ දිනයෙහි සිට ගණන් ගත යුතු එක් මාසයක කාලසීමාවක් ඇතුළත කළ හැකි ය. ඒ ආයාචනය නියම බලධරයා මගින් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ආයාචනයක් ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක, ඒ නිල නිවාසය සම්බන්ධයෙන් ආයාචක වෙත භාර දෙන ලද අස් කිරීමේ දැන්වීම ක්‍රියාත්මක වීම, ඒ ආයාචනය සම්බන්ධයෙන් නිරණයක් කරනු ලබන තුරු නතර විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ආයාචනයක් ඉදිරිපත් කරනු ලැබූ විට, අමාත්‍යවරයා විසින්—

(අ) ආයාචනයට ඉඩ දෙමින්; හෝ

(ආ) සම්පූර්ණයෙන් හෝ අස් කිරීමේ දැන්වීම ක්‍රියාත්මක වීම නියමයෙහි සඳහන් කාලසීමාව තුළ නැවැත්විය යුතු ය යන කොන්දේසියට යටත්ව හෝ ඉඩ නොදෙමින්

නියමයක් කළ හැකි ය.

(4) එවැනි ආයාචනයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක විය යුතු අතර කිසිම අධිකරණයක දී එය ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

අස් කිරීමේ දැන්වීමක් අනුව ක්‍රියා කිරීමට බැඳී සිටින බව.

5. යම් පළාත් පාලන ආයතන නිල නිවාසයක පදිංචිකරු වෙත අස් කිරීමේ දැන්වීමක් භාර දෙනු ලැබ ඇති අවස්ථාවක—

(අ) ඒ දැන්වීමෙන් එම පදිංචිකරුට ඒ නිල නිවාසය හිස් කොට යන ලෙස නියම කොට ඇත්තේ යම් කාලසීමාවක් ඇතුළත ද ඒ කාලසීමාව ඉකුත්වීමෙන් පසුව ඒ නිල නිවාසයේ පදිංචිව සිටීමට ඒ පදිංචිකරු හෝ ඔහුගේ යම් යැපෙන්නකු හෝ හිමිකම් නොලැබිය යුතු ය; තව ද

(ආ) අස් කිරීමේ දැන්වීමෙන් ඒ නිල නිවාසය හිස් කොට භාර දීමට නියම කර ඇත්තේ යම් බලධරයකුට හෝ තැනැත්තකුට ද ඒ බලධරයාට හෝ තැනැත්තාට ඒ කාලසීමාව ඉකුත් වීමට පෙර, ඒ පදිංචිකරු විසින් ඒ නිල නිවාසය හිස්කර භාර දිය යුතු ය.

අස් කිරීමේ දැන්වීමක් අනුව හෝ ආයාචනයේ දී අමාත්‍යවරයාගේ නියමය අනුව හෝ ක්‍රියා නොකිරීමේ ප්‍රතිඵලය.

6. (1) යම් පළාත් පාලන ආයතන නිවාසයක පදිංචිකරු, එවැනි යම් නිල නිවාසයක් පිළිබඳව තමා වෙත භාර දෙනු ලැබූ යම් අස් කිරීමේ දැන්වීමක් හෝ 4(3) වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් කරනු ලැබූ නියමයක් හෝ සම්බන්ධයෙන් 5 වන වගන්තියේ (ආ) ඡේදයෙහි විධිවිධාන අනුව ක්‍රියා කිරීම පැහැර හරින ඕනෑම අවස්ථාවක, නියම බලධරයා විසින්—

(අ) මෙහි පහත දැක්වෙන කරුණු, එනම්:—

(i) මේ පනතේ කාර්ය සඳහා තමා නියම බලධරයකු වන බව,

(ii) ඒ නිල නිවාසයෙහි පදිංචිකරු වෙත අස් කිරීමේ දැන්වීමක් භාර දෙනු ලැබූ බව,

(iii) පදිංචිකරු වෙත ඒ අස් කිරීමේ දැන්වීම භාර දීමට හේතුව, සහ

(iv) ඒ නිල නිවාසයට අදාළ එම දැන්වීම සම්බන්ධයෙන්, අවස්ථාවෝචිත පරිදි, 5 වන වගන්තියේ (ආ) ඡේදයෙහි විධිවිධාන අනුව හෝ 4(3) වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් කරනු ලැබූ නියමය අනුව හෝ ක්‍රියා කිරීම ඒ පදිංචිකරු විසින් පැහැර හැර ඇති බව

දක්වමින්; සහ

(ආ) ඒ නිල නිවාසයෙහි සන්තකය ආපසු ලබා ගැනීම සඳහා සහ එම පදිංචිකරු සහ ඔහුගේ යැපෙන්නන් කිසිවකු වෙතොත් ඔවුන් ද ඒ නිල නිවාසයෙන් නෙරපා දැමීම සඳහා අයැදිමින්,

මේ පනතේ උපලේඛනයේ දක්වා ඇති "ආ" ආකෘතියෙහි, ඒ නිල නිවාසය පිහිටා ඇති ප්‍රදේශය විෂයයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉල්ලීමක් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ සෑම ඉල්ලීමක් ම ඒ ඉල්ලීමෙහි දක්වා ඇති කරුණු සනාථ කරන පනතේ උපලේඛනයේ දක්වා ඇති "ඇ" ආකෘතියෙහි වූ දිවුරුම් පත්‍රයකින් තහවුරු කළ යුතු අතර, අස් කිරීමේ දැන්වීමේ පිටපතක් ද ඒ සමඟ යැවිය යුතු ය.

(3) මේ වගන්තියේ ඉහත සඳහන් විධිවිධාන යටතේ දිවුරුම් පත්‍රයකින් තහවුරු කරනු ලැබුවා වූ ද අස් කිරීමේ දැන්වීමෙහි පිටපතක් සමඟ වූ ද සෑම ඉල්ලීමක් ම "නෙරපීම සඳහා වූ ඉල්ලීමක්" යනුවෙන් මේ පනතෙහි සඳහන් කරනු ලැබේ.

(4) නෙරපීම සඳහා වූ සෑම ඉල්ලීමක් ම එහි ප්‍රකාශිත කරුණු සම්බන්ධයෙන් තීරණාත්මක සාක්ෂිය විය යුතු ය.

(5) නෙරපීම සඳහා වූ යම් ඉල්ලීමක් සඳහා මුද්දර ගාස්තුවක් නොගෙවිය යුතු ය.

නෙරපීම සඳහා වූ ඉල්ලීමක් ලැබුණු විට අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ගය.

7. යම් පළාත් පාලන ආයතන නිල නිවාසයක් සම්බන්ධයෙන් නෙරපීම සඳහා වූ ඉල්ලීමක් ලැබුණු විට, එවිට බලපත්‍රය නිකුත් කරනු ලැබූ දින සිට සම්පූර්ණ දින තුනකට කලින් නොවූ හෝ සම්පූර්ණ දින හතකට පසුව නොවූ එවිට බලපත්‍රයෙහි සඳහන් දිනයකට පෙර ඒ නිල නිවාසයේ සන්තකය නියම බලධරයාට හෝ ඒ ස්ථානය භාර ගැනීමට බලය දෙනු ලැබූ සහ අස් කිරීමේ දැන්වීමෙහි සඳහන් වෙනත් තැනැත්තාට හෝ භාර දෙන ලෙස පිස්කල්ට නියම කරමින් සහ බලය දෙමින් මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් එම අධිකරණයේ පිස්කල් වෙත සන්තකය භාර දීමේ එවිට බලපත්‍රයක් වහාම නිකුත් කළ යුතු අතර අවශ්‍ය වුවහොත් එය නැවත නිකුත් කළ යුතු ය. එකී පිස්කල්ට හෝ ඔහු විසින් තත් කාර්ය සඳහා බලය දෙනු ලැබූ යම් පොලිස් නිලධරයකුට, ඒ පිස්කල් හෝ බලධරයා අවශ්‍ය යයි සලකන සහායකයන් ද සමඟ ඒ නිල නිවාසයට ඇතුළුවීම සඳහාත්, ඒ අනුව සන්තකය භාර දීම සඳහාත්, පදිංචිකරු හා ඔහුගේ යැපෙන්නන් කිසිවකු වෙතොත් ඔවුන් ද ඒ නිවාසයෙන් නෙරපීම සඳහාත් ඒ එවිට බලපත්‍රය ප්‍රමාණවත් අධිකාරයක් විය යුතු ය.

…වල් …ලී පනත …දළවීම …හැර කිරීම.

8. 1972 අංක 7 දරන ගෙවල් කුලී පනතෙහි විධිවිධාන යම් පළාත් පාලන ආයතන නිල නිවාසයක පදිංචිව සිටින යම් තැනැත්තකු නෙරපීම සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

9. (1) මේ පනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බලගැන්වීමේ කාර්යය සඳහා හෝ පළාත් පාලන ආයතනවල සේවා නියුක්තයන්ට පළාත් පාලන ආයතන නිල නිවාස වෙන්කර දෙනු ලැබිය හැක්කේ යම් නියමවලට හා කොන්දේසිවලට යටත්ව ද, ඒ නියම සහ කොන්දේසි නියම කිරීම සඳහා අමාත්‍යවරයා විසින් කලින් කල නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දිනයෙහි හෝ එහි සඳහන් කරනු ලබන යම් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන්නේ යම් දිනයක ද ඒ දිනය පිළිබඳ දැන්වීමක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

10. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුව හොත් මිස, මේ පනතෙහි— අර්ථ නිරූපණය.

" නියම බලධරයා " යන්නෙන්—

(අ) මහා නගර සභාවක් සම්බන්ධයෙන් වූ විට, ඒ සභාවේ මහා නගර සභා කොමසාරිස් ;

(ආ) නගර සභාවක් හෝ සුළු නගර සභාවක් සම්බන්ධයෙන් වූ විට, ඒ නගර සභාවේ හෝ සුළු නගර සභාවේ ලේකම් ;

(ඇ) ගම් සභාවක් සම්බන්ධයෙන් වූ විට, ඒ සභාව පිහිටා ඇති කොට්ඨාසයේ සහකාර පළාත් පාලන කොමසාරිස් විසින් ඒ කාර්යය සඳහා නම් කරනු ලැබූ ඒ සභාවේ නිලධරයෙක් ; සහ

(ඈ) යම් මහා නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටුකරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටුකිරීම සඳහා යම්කිසි නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇති කොට, පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරයක් සම්බන්ධයෙන් වන විට, ඒ අධිකාරය පිහිටියේ යම් කොට්ඨාසයක ද ඒ කොට්ඨාසයේ සහකාර පළාත් පාලන කොමසාරිස්වරයා විසින් තත් කාර්යය සඳහා නම් කරනු ලැබූ, අධිකාරයේ නිලධරයෙක්

අදහස් වේ ;

"යැපෙන්නා" යන්න යම් පළාත් පාලන ආයතන නිල නිවාසයක පදිංචිකරු සම්බන්ධයෙන් යෙදෙන විට, ස්වාමි පුරුෂයා හෝ භාර්යාව හෝ දරුවා වශයෙන් හෝ අන්‍යාකාරයකින් පදිංචිකරුගෙන් යැපෙන්නකු වූ යම් තැනැත්තකු අදහස් වන අතර, ඒ නිල නිවාසයෙහි පදිංචිව සිටීමට පදිංචිකරු විසින් අවසර දෙනු ලැබ ඇති වෙනත් යම් තැනැත්තෙක් ද ඊට ඇතුළත් වේ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන් යම් මහා නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වන අතර ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටුකරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම්කිසි නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇති කොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරයක් ඊට ඇතුළත් වේ;

"පළාත් පාලන ආයතන නිල නිවාස" යන්නෙන් යම් පළාත් පාලන ආයතනයක් විසින් හෝ වෙනුවෙන් සපයනු ලබන වාසය කිරීමේ කාර්ය සඳහා පදිංචි වී ඇති හෝ පාවිච්චි කරනු ලබන යම් ගොඩනැගිල්ලක් හෝ කාමරයක් හෝ වෙනත් ඉඩකඩක් අදහස් වන අතර, ඒ ගොඩනැගිල්ල හෝ කාමරය හෝ වෙනත් ඉඩකඩ පිහිටා ඇති යම් ඉඩමක් හෝ ස්ථානයක් ද ඊට ඇතුළත් වේ;

"පදිංචිකරු" යන්නට පදිංචිකරු මිය ගිය කල්හි, පදිංචිකරුගේ යැපෙන්නෙක් ද ඇතුළත් වේ.

## උපලේඛනය

### 3 (5) වන වගන්තිය

### "අ" ආකෘතිය

### අස් කිරීමේ දැන්වීම

පළාත් පාලන ආයතන නිල නිවාස (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනතේ කාර්යය සඳහා නියම බලධරයකු වූ ............................(නම සහ පදවි නාමය සඳහන් කරන්න.) වන මම, ඒ පනතේ 3 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ................................(නිල නිවාසයෙහි ලිපිනය සඳහන් කරන්න) දරන පළාත් පාලන ආයතන නිල නිවාසයෙහි පදිංචිකරු වූ.............. ..............(නම ද පදවි නාමයක් වේනොත් එය ද සඳහන් කරන්න) වන ඔබට, ............................ (දිනය සඳහන් කරන්න) වන දින ආරම්භ වන මාස ....................... කාලසීමාවක් ඉකුත්වීමට පෙර ............................ (*අස් කිරීමට හේතු වූ කරුණ සඳහන් කරන්න) නිසා, ............................ (පළාත් පාලන ආයතනය සඳහන් කරන්න) විසින් සම්මත කරන ලද ......... ........... වන දින අංක ........... දරන යෝජනා සම්මතය අනුව —

(අ) ඔබේ යැපෙන්නන් කිසිවකු වේනොත් ඔවුන් ද සමග ඒ නිල නිවාසය හිස් කොට යන ලෙස; සහ

(ආ) ඒ නිල නිවාසයේ හිස් සන්තකය ඒ පනතේ කාර්ය සඳහා නියම බලධරයකු වූ ............................ (නම සහ පදවි නාමය සඳහන් කරන්න) මා වෙත†/හෝ ........................................ (නම ද පදවි නාමයක් වේනොත් එය ද සඳහන් කරන්න) වෙත භාර දෙන ලෙස

නියම කරමි.

නියම බලධරයාගේ අත්සන සහ
පදවි නාමය.

දින :

* අදාළ නොවන කොටස කපා හරින්න.

† පළාත් පාලන ආයතන නිල නිවාසය එම නිවාසයේ පදිංචිකරුට දෙනු ලැබුවේ යම් කාලසීමාවක් සඳහා ද ඒ කාලසීමාව ඉකුත් වී තිබේ ද යන වග හෝ ඒ නිල නිවාසයේ පදිංචිවීමට ඒ පදිංචිකරුට සුදුසුකම් ලබා දුන් සේවා ස්ථානයෙන් ඔහු මාරු කරනු ලැබ තිබේ ද යන වග හෝ ඒ නිල නිවාසයේ පදිංචිවීමට ඒ පදිංචිකරුට සුදුසුකම් ලබා දුන් තනතුරෙන් ඔහු මාරු කරනු ලැබ තිබේ ද යන වග හෝ මුලින් ම ඒ නිල නිවාසය දෙනු ලැබූ පදිංචිකරු තම තනතුරෙන් ඉල්ලා අස් වී තිබේ ද, විශ්‍රාම ගෙන තිබේ ද, තම තනතුර හිස් කර තිබේ ද, ඔහුගේ සේවය නතර කර තිබේ ද නැතහොත් ඔහු මිය ගොස් තිබේ ද යන වග සඳහන් කරන්න.

6 වන වගන්තිය

"ආ" ආකෘතිය

නෙරපීම සඳහා ඉල්ලීම

........................ මහේස්ත්‍රාත් අධිකරණය වෙත ය.

(අධිකරණයේ නම සඳහන් කරන්න.)

පළාත් පාලන ආයතන නිල නිවාස (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනතේ කාර්ය සඳහා නියම බලධරයකු වූ ...... ..................... (නම ද පදවි නාමය ද සඳහන් කරන්න) වන මම, ඒ පනතේ 6 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මේ ඉල්ලීම මගින්—

(අ) පහත සඳහන් කරුණු ඉදිරිපත් කරමි. එනම්:—

(i) ඒ නියම බලධරයා මම වෙමි;

(ii) (පිටපතක් මෙම ඉල්ලීමට අමුණා ඇති) අස් කිරීමේ දැන්වීමක් ............................ (නිවාසයේ ලිපිනය සඳහන් කරන්න) දරන පළාත් පාලන ආයතන නිවාසයේ පදිංචිකරු වූ .............. .............. (නම ද පදවි නාමයක් වේ නම් එය ද සඳහන් කරන්න) වෙත ............................ (පළාත් පාලන ආයතනය සඳහන් කරන්න) විසින් සම්මත කරන ලද ................ දින අංක ........... දරන යෝජනා සම්මතයක් අනුව භාර දෙන ලදී;

(iii) ඒ පදිංචිකරු වෙත ඉහත කී පරිදි ඒ අස් කිරීමේ දැන්වීම භාර දෙනු ලැබීමට හේතු වූ කරුණ *............................ වේ; සහ

(iv) ඒ නිල නිවාසය පිළිබඳ එම දැන්වීම සම්බන්ධයෙන් ඒ පනතේ 5 වන වගන්තියේ (ආ) ඡේදයෙහි විධිවිධාන අනුව හෝ ඒ පනතේ 4 (3) වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් කරනු ලැබූ (පිටපතක් මෙම ඉල්ලීමට අමුණා ඇති) නියමය අනුව හෝ ක්‍රියා කිරීම ඒ පදිංචිකරු විසින් පැහැර හැර තිබේ; එබැවින්

(ආ) ඒ ස්ථානයෙහි සන්තකය ආපසු ලබා දෙන ලෙසත් ඒ පදිංචිකරු සහ ඔහුගේ යැපෙන්නන් කිසිවකු වේ නම් ඔවුන් ද ඒ ස්ථානයෙන් නෙරපන ලෙසත් අයැද සිටිමි.

නියම බලධරයාගේ අත්සන සහ පදවි නාමය.

දිනය :..................

* පළාත් පාලන ආයතන නිල නිවාසය ඒ නිවාසයේ පදිංචිකරුට දෙනු ලැබුවේ යම් කාලසීමාවකට ද ඒ කාලසීමාව ඉකුත් වී තිබේ ද යන වග හෝ ඒ නිල නිවාසයේ පදිංචිවීමට ඒ පදිංචිකරුට සුදුසුකම ලබා දුන් සේවා ස්ථානයෙන් ඔහු මාරු කරනු ලැබ තිබේ ද යන වග හෝ ඒ නිල නිවාසයේ පදිංචිවීමට ඒ පදිංචිකරුට සුදුසුකම ලබා දුන් තනතුරෙන් ඔහු මාරු කරනු ලැබ තිබේ ද යන වග හෝ මුලින් ම ඒ නිල නිවාසය දෙනු ලැබූ පදිංචිකරු තම තනතුරෙන් ඉල්ලා අස් වී තිබේ ද, විශ්‍රාම ගොස් තිබේ ද, තම තනතුර හිස් කර තිබේ ද, ඔහුගේ සේවය නතර කර තිබේ ද නැතහොත් ඔහු මිය ගොස් තිබේ ද යන වග සඳහන් කරන්න.

"ඇ" ආකෘතිය

## දිවුරුම් පත්‍රය

............................... (නම ද පදවි නාමය ද සඳහන් කරන්න) වන මම පළාත් පාලන ආයතන නිල නිවාස (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනතේ 5 (2) වන වගන්තියෙන් නියමිත පරිදි—

(අ) ඒ පනතේ කාර්ය සඳහා මා නියම බලධරයකු බවත් ;

(ආ) ............................... (පළාත් පාලන ආයතනය සඳහන් කරන්න) විසින් සම්මත කරන ලද ............................... දින අංක ............ දරන යෝජනාවක් අනුව, (නෙරපීම සඳහා වූ මගේ ඉල්ලීමට පිටපතක් අමුණා ඇති) අත් කිරීමේ දැන්වීමක් ............... (නිල නිවාසයේ ලිපිනය සඳහන් කරන්න) දරන පළාත් පාලන ආයතන නිල නිවාසයේ පදිංචිකරු වූ ............................... (නම ද පදවි නාමයක් වෙතොත් එය ද සඳහන් කරන්න) වෙත එම පනත යටතේ භාර දෙනු ලැබූ බවත් ;

(ඇ) ඒ පදිංචිකරු වෙත ඉහත කී පරිදි ඒ අත් කිරීමේ දැන්වීම භාර දෙනු ලැබීමට හේතු වූ කරුණ *............................... බවත් ;

(ඈ) ඒ නිල නිවාසය පිළිබඳ එම දැන්වීම සම්බන්ධයෙන් ඒ පනතේ 5 වන වගන්තියේ (ආ) ඡේදයෙහි විධිවිධාන අනුව හෝ ඒ පනතේ 4 (3) වන වගන්තිය යටතේ වූ අමාත්‍යවරයාගේ නියමය අනුව හෝ (නෙරපීම සඳහා වූ මගේ ඉල්ලීමට ඒ නියමයෙහි පිටපතක් අමුණා ඇත.) ක්‍රියා කිරීම පදිංචිකරු විසින් පැහැර හැර ඇති බවත්

ගාම්භීරතා පූර්වකව ද, අවංකව ද, සත්‍ය ලෙස ද මෙයින් ප්‍රතිඥා දී ප්‍රකාශ කර සිටිමි./දිවුරමි.

සිද්ධි ප්‍රකාශකයාගේ අත්සන සහ
පදවි නාමය.

සිද්ධි ප්‍රකාශක විසින් ............................... වන දින වූ මෙදින මා ඉදිරියේ
(දිනය සඳහන් කරන්න)

දී ප්‍රතිඥා දෙන ලදී./දිවුරන ලදී.

ප්‍රතිඥාව/දිවුරුම් කරවන තැනැත්තාගේ අත්සන
සහ පදවි නාමයක් වෙතොත් එය.

* පළාත් පාලන ආයතන නිල නිවාසය පදිංචිකරුට දෙනු ලැබුවේ යම් කාලසීමාවකට ද ඒ කාලසීමාව ඉකුත් වී තිබේ ද යන වග හෝ ඒ නිල නිවාසයේ පදිංචි වීමට ඒ පදිංචිකරුට සුදුසුකම් ලබා දුන් සේවා ස්ථානයෙන් ඔහු මාරු කරනු ලැබ තිබේ ද යන වග හෝ ඒ නිල නිවාසයේ පදිංචිවීමට ඒ පදිංචිකරුට සුදුසුකම ලබා දුන් තනතුරෙන් ඔහු මාරු කරනු ලැබ තිබේ ද යන වග හෝ මුලින්ම ඒ නිල නිවාසය දෙනු ලැබූ පදිංචිකරු තම තනතුරෙන් ඉල්ලා අස් වී තිබේ ද, විශ්‍රාම ගෙන තිබේ ද, තම තනතුර හිස් කර තිබේ ද, ඔහුගේ සේවය නතර කර තිබේ ද නැතහොත් ඔහු මිය ගොස් තිබේ ද යන වග සඳහන් කරන්න.

8—ඒ 35918 (78/08)